කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

2017/2018 අධ්‍යයන වර්ෂය

ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර

දෙවන අර්ධවාර්ෂික පරීක්ෂණය - 2020 ජනවාරි/පෙබරවාරි

සමාජ සංඛ්‍යානය

SOST 22232 : දත්ත රැස්කිරීම හා සමීක්ෂණ කළමනාකරණය

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 02 යි.

---

01. (i) පර්යේෂණ යෝජනාවලියක අන්තර්ගත විය යුතු ප්‍රධාන ලක්ෂණ පහක් (05) නම් කරන්න. (ලකුණු 1x5=05)

(ii) එම ප්‍රධාන ලක්ෂණ අතුරින් තුනක් (03) තෝරා ඒ පිළිබඳ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 3x5=15)

02. (i) ප්‍රාථමික දත්ත (Primary data) හඳුන්වා එම දත්ත රැස්කළ හැකි නිරීක්ෂණ ක්‍රමයේ සීමාවන් සහ වාසි අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) (අ) නියැදි තරම තීරණය කළයුතු ආකාරය පිළිබඳව භාවිත කරන " යමානේ ක්‍රමය " (Yamane Method) පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ) සංගහනයේ තරම (N) 255591 යැයි උපකල්පනය කළහොත් ප්‍රමාණවත් නියැදියක් යමානේ ක්‍රමය මගින් ලබාගත හැකි ද? ඒ සඳහා සැලකිය යුතු වෙනත් කරුණු තබේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

03. පර්යේෂණ ක්‍රමවේදයේදී භාවිතා කරන ප්‍රමාණාත්මක ක්‍රමය (Quantitative Method) සහ ගුණාත්මක ක්‍රමය (Qualitative Method) පිළිබඳව උදාහරණ සහිතව පහදා මෙම ක්‍රම දෙකෙහි ඇති වාසි සහ අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. (i) ප්‍රශ්නාවලියක් යනු කුමක්දැයි හඳුන්වා ප්‍රශ්නාවලියක ප්‍රශ්න අන්තර්ගත කළයුතු ආකාරය පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ප්‍රශ්නාවලියක් පූර්ව පරීක්ෂාවකට (Pre test) ලක් කළ යුත්තේ ඇයිදැයි විමසන්න.

(ලකුණු 05)

(iii) ප්‍රශ්නවාලියක වලංගුභාවය සහ විශ්වසනීයත්වය සුරැකීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුන්වන්න. (ලකුණු 05)

05. (i) ද්විතීයික දත්ත (Secondary data) රැස්කිරීමේ ඇති වැදගත්කම පෙන්වා දී එහි වාසි සහ අවාසි විමසන්න. (ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාව සහ අන්තර් ජාලය පාදක කරගනිමින් ද්විතීයික දත්ත ලබාගතහැකි ප්‍රධාන හා විශ්වසනීය මූලාශ්‍රයක් පෙන්වා දී ඒ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) පහත සඳහන් මාතෘකා කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (Focus group Discussions)

(ආ) සිද්ධි අධ්‍යයනය (Case studies) (ලකුණු 08)

06. (i) පර්යේෂණ ආචාරධර්ම (Research Ethics) යනු මොනවාදැයි හඳුන්වා පර්යේෂණ ආචාරධර්මවල ඇති වැදගත්කම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) සම්මුඛ සාකච්ඡා ක්‍රමයේදී පර්යේෂණ ආචාරධර්මවලට පටහැනි වන අවස්ථා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. පහත මාතෘකා අතුරින් හතරක් (04) පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න.

(i) හිමබෝල නියැදීම

(ii) පොකුරු නියැදීම

(iii) දත්ත පරිමාණ

(iv) සංගහනය

(v) සසම්භාවී නියැදීම

(ලකුණු 5x4=20)